**කෝරලේපත්තු උතුර ප්‍රාදේශීය සභාව**
**මඩකලපුව දිස්ත්‍රික්කය**
**--------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 22 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර ඒ පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 08 දින සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කෝරලේපත්තු උතුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය ආරම්භයේදී මූල්‍ය ප්‍රකාශනවල සේවක ණය ශේෂය රු.2,534,402 ක් දැක්වුවත්, ප්‍රාදේශීය සභා සේවක ණය ලේඛනයේ ආරම්භක ශේෂය රු.2,210,576 ක් පමණක් දක්වා තිබුණි. | ශේෂයන් දෙක එකඟ කිරීම සඳහා කටයුතු කළ යුතු වීම. | පිළිගෙන ඇත. |
| (ආ) | මෝටර් වාහන හා කරත්තවල වටිනාකම වර්ෂ 10 කට අධික කාලයක සිට තක්සේරු නොකර හෝ ප්‍රත්‍යාගණනය නොකර ගිණුම්වල එකතුව රු.243,500 ක් පෙන්වා තිබුණි. | වත්කම්වල වටිනාකම තක්සේරු කර හෝ ප්‍රත්‍යාගණනය කර ගිණුම්වල දැක්විය යුතු වීම. | පිළිගෙන ඇත. |
| (ඇ) | ඉඩම් හා ගොඩනැගිලිවල මුළු වටිනාකම රු.87,251,075 ක එකතුවක් ලෙස ගිණුම්වල වර්ෂ 10 කට අධික කාලයක සිට ප්‍රත්‍යාගණනයක් සිදු නොකර දක්වා තිබුණි. | වත්කම්වල වටිනාකම තක්සේරු කර හෝ ප්‍රත්‍යාගණනය කර ගිණුම්වල දැක්විය යුතු වීම. | පිළිගෙන ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සභාවේ සමාලෝචිත වර්ෂය අවසානයේ පිරියත හා යන්ත්‍රෝපකරණවල මුළු වටිනාකම රු.13,088,075 ක එකතුවක් ලෙස වර්ෂ 10 කට අධික කාලයක සිට ප්‍රත්‍යාගණනයක් සිදු නොකර දක්වා තිබුණි. | ප්‍රත්‍යාගණනය කර ගිණුම්වල ඉදිරිපත් කළ යුතුය. | පිළිගෙන ඇත. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ සභාවේ ඉදිරිපස කාර්යාල මුහුණත අලංකාරය ඇති කිරීම පිණිස පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් මිලදී ගෙන සභාවට ලබාදුන් පරිගණක ගිණුම්ගත කර නොතිබුණි. | පරිගණකවල වටිනාකම ගිණුම්ගත කළ යුතු වීම. | පිළිගෙන ඇත. |

### 1.3.2 අසම්භාව්‍ය බැරකම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| බාහිර පාර්ශවයන්ට එරෙහිව නඩු පවරා තිබූ අතර, ඒ පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කර නොතිබුණි. | තොරතුරු හෙළිදරව් කළ යුතු වීම. | පිළිගෙන ඇත. |

### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

#### (අ) ලැබිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | මූල්‍ය ප්‍රකාශනවල හිඟ හිටව පැවැති බලපත්‍ර ගාස්තු රු.29,612 ක් අඛණ්ඩව වර්ෂ 10 කට අධික කාලයක සිට ගිණුම්වල ඉදිරිපත් කර තිබුණි. එසේ වුවත්, ඒ පිලිබඳ උපලේඛන, පොත්පත් සහ තහවුරු කළ හැකි සාක්ෂි කිසිවක් නොමැතිව ගිණුම්වල ඉදිරිපත් කරමින් පැවතුණු අතර, හිඟ මුදල් අයකිරීමට හෝ පොත්වලින් කපාහැරීමට කටයුතු කර නොතිබුණි. | හිඟ හිටි වටිනාකම පොත්වලින් කපා හැරීමට කටයුතු කළ යුතුය. | මෙම හිඟහිටි වටිනාකම පොත්වලින් කපාහැරීමට ක්‍රියාකර ඇති බව කාරුණිකව දැනුම් දෙමි. |

| | | | |
|---|---|---|---|
| (ii) | විශ්‍රාම ගිය, සේවය හැර ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයකළ යුතු රු.220,826 හිඟ ණය විශ්‍රාම පාරිතෝෂිකයෙන් හෝ ඇපකරුවන්ගෙන් ඇපකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි. | හිඟ ණය ශේෂ විශ්‍රාම පාරිතෝෂිකයෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | මෙම ණය ශේෂය විශ්‍රාම පාරිතෝෂිකයෙන් අය කරගැනීමට කටයුතු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |

**1.3.4 විගණනයට අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම**

**විස්තර ඉදිරිපත් නොකිරීම**

| | ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| 1 | ඉඩම් හා ගොඩනැගිලි | 87,251,496 | ඉඩම් ඔප්පු ස්ථාවර වත්කම් ලේඛනය | ස්ථාවර වත්කම් ලේඛනයපවත්වා ගෙන යාම | මූල්‍ය ප්‍රකාශනයේ ඉදිරිපත් කර ඇති ඉඩම් හා ගොඩනැගිලි සඳහා ලේඛන තවම කෝරලේපත්තු උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා දී නොතිබුණි. මේ සඳහා ක්‍රියාමාර්ග පළාත් පාලන ආයතන සහ වත්කම් පිළිබඳ ලේඛන සභාවේ පවත්වාගෙන යනු ලැබේ. තවද, ගබඩා අයිතමයන් සඳහා ලැයිස්තු ද ඇති බව කාරුණිකව දන්වමි. |
| 2. | පිරියත හා උපකරණ | 13,088,075 | ස්ථාවර වත්කම් ලේඛන, තහවුරු කිරීමේ ලේඛන | ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගෙන යාම | |
| | මෝටර් රථ හා කරත්ත | 243,500 | | | |
| 3. | පොදු ගබඩාව | 24,003 | තොග ලේඛන | තොග ලේඛන පවත්වා ගෙන යාම | |

**1.4 අනුකූල නොවීම්**

**1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව**

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 12(1) සහ (2) වගන්තිය සහ පළාත් පාලන නිවාස ඉදිකිරීම් හා කර්මාන්ත | ප්‍රාදේශීය සභාවේ කාර්යයන් ලිහිල් කිරීමේ අරමුණින්, සම්පූර්ණ වූ තීරණ ලබාගැනීමටත් සභාවේ අරමුදල්, ප්‍රතිපත්ති සැලසුම්, නිවාස ඉදිකිරීම්, සමාජ සංවර්ධනය, | කමිටු රැස්වීම් පැවැත්වීම සඳහා කටයුතු කළ යුතු වීම. | මෙම කමිටුවල අවශ්‍යතාවය ඇති වූ විටෙක ඒවා පැවැත්වීමට කටයුතු කරනු ලබන බව |

| | | | | |
|---|---|---|---|---|
| | අමාත්‍යාංශයේ 1988 ජනවාරි 13 දිනැති අංක 488/16 දරන ගැසට් නිවේදනයේ 31(1) උප වගන්තිය | තාක්ෂණික සේවාවන්, පාරිසරික හා මහජන උපයෝගීතා වැනි කාරණා සඳහා වෙන වෙනම කමිටු ස්ථාපිත කර තිබුණත්, එම කමිටු විගණන දිනට වන 2019 මැයි 10 දින වන විටත් කමිටු රැස්වීම් පැවැත්වීම සඳහා කටයුතු කර නොතිබුණි. | | කාරුණිකව දන්වා සිටිමි. |
| (ආ) | 1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති මාලාවේ X පරිච්ඡේදයේ 193 වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා තථ්‍ය ආදායම් සහ වියදම් පිළිබඳ විස්තර අයවැය සැලැස්ම සමඟ සසඳා විචලනයන් සඳහා පැහැදිලි කිරීම් අඩංගු ප්‍රකාශයක් සකස් කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | තථ්‍ය ආදායම් හා වියදම් පිළිබඳ විස්තර අයවැය සැලැස්ම සමඟ සසඳා විචලනයන් සඳහා පැහැදිලි කිරීම් සඳහන් කළ යුතු වීම. | ගැලපීම් සිදු කරනු ලබන බව කාරුණිකව දැනුම් දෙමි. |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා පරගණක උපකරණ හා මෘදුකාංග ලේඛනගත කිරිම සඳහා වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | චක්‍රලේඛයට අනුව කටයුතු කළයුතු වීම. | පරිගණක හා පරිගණක උපකරණ, මෘදුකාංග යනාදිය ලේඛනගත කිරීම සඳහා පොත්පත් පවත්වාගෙන යාමට මෙම වර්ෂයේ කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.3,219,456 ක් වූ අතර ඉකුත් වර්ෂය සමග සැසඳීමේ දී ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.5,742,067 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,522,611 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

### 2.2 ආදායම් පරිපාලනය

----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

-----------------------------------------------------------------------------------------

සමාලොචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2018 ඇස්තමේන්තුගත ආදායම් | ලැයිස්තුගත කළ ආදායම් | අයකළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය | 2017 ඇස්තමේන්තුගත ආදායම් | ලැයිස්තුගත කළ ආදායම් | අයකළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 3,800,000 | 3,800,000 | 1,605,822 | 2,194,178 | 710,000 | 710,000 | 997,853 | 287,853 |
| කුලී | 4,197,000 | 4,543,800 | 1,753,339 | 2,790,461 | 2,935,000 | 2,935,000 | 2,588,200 | 346,800 |
| බලපත්‍ර ගාස්තු | 717,000 | 717,000 | 647,070 | 69,930 | 635,000 | 635,000 | 689,600 | 54,600 |
| අනෙකුත් ආදායම් | 2,920,000 | 3,888,000 | 1,630,140 | 2,257860 | 3,330,000 | 3,330,000 | 2,362,000 | 968,000 |
| **එකතුව** | **11,634,000** | **12,948,800** | **5,636,371** | **7,312,429** | **7,610,000** | **7,610,000** | **6,637,653** | **1,657,253** |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2017 දෙසැම්බර් 31 දිනට හිඟහිටව පැවැති බලපත්‍ර ගාස්තු රු.29,612 ක් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතු වීම. | මෙම හිඟ ගාස්තු කපා හැරීමට පළාත් පාලන කොමසාරිස්වරයා මඟින් අයකර ගැනීමට කටයුතු කර ඇති බව කාරුණිකව දන්වමි. |
| (ii) | JCB යන්ත්‍රයේ උපයෝජනය<br>ප්‍රාදේශීය සභාව විසින් දේශීය ණය සංවර්ධන අරමුදලෙන් (LLDF) JCB යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා 2016 සැප්තැම්බර් 06 දින ඉහත අරමුදල සමඟ ගිවිසුම් ගත වී මෙම යන්ත්‍රය මිලදී ගෙන තිබුණි. මෙම යන්ත්‍රයේ භාවිතය පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (අ) | ප්‍රාදේශීය සභාව විසින් මෙම යන්ත්‍රය මිලදී ගැනීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය පහසුකම් නොමැති වීමෙන් සභාව විසින් දේශීය ණය සංවර්ධන අරමුදල යටතේ ණය ලබා JCB යන්ත්‍රය මිලදී ගැනීමට තීරණය කර තිබුණි. සභාවේ අරමුදලෙන් රු.2,380,000 ක් සහ ණය අරමුදල මඟින් රු.9,520,000 ක් මඟින් රු.11,900,000 කට මිලදී ගෙන තිබුණි. එසේම පළාත් පාලන අමාත්‍යාංශය මඟින් 2015 ජුලි 02 දින පරිත්‍යාග ලෙස JCB යන්ත්‍රයක් ලැබී තිබුණි. | ණය පදනමින් මිලදී ගත් JCB යන්ත්‍රය සභාවට ආදායම් උපයා ගැනීමේ ආකාරයට භාවිතා කළ යුතු වීම. | 2018 වර්ෂයේ නව සභාව ස්ථාපිත කිරීමේදී මහජන අවශ්‍යතා අධික වීම නිසා JCB යන්ත්‍රයේ උපයෝජනය මහජනයා වෙනුවෙන් වූ සේවාවන්ට ප්‍රමුඛත්වය දී නොමිලයේ සිදුකිරීම නිසා සභාවට පාඩු ලැබීමට සිදු වී තිබූ බව කාරුණිකව දන්වමි. |

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| | ආදායම් ඉහළ නංවා ගැනීමේ අරමුණෙන් මිලදී ගෙන තිබූ මෙම යන්ත්‍ර භාවිතය මගින් සභාවට පාඩු වී තිබුණි. | | |
| (ආ) | ප්‍රාදේශීය සභාව සමාලෝචිත වර්ෂයේ මෙම යන්ත්‍රය, යන්ත්‍ර පැය 1560 ක් භාවිතා කර තිබුණි. මේ අනුව, ඉන්ධන, යන්ත්‍ර අලුත්වැඩියාව, රියදුරු වැටුප් සඳහා ආසන්න වශයෙන් රු.2,009,600 ක් වැය කර තිබුණි. සභාවේ කාර්යයන් හැර අනෙකුත් කාර්යයන් සඳහා මෙම යන්ත්‍රය, යන්ත්‍ර පැය 564 ක් භාවිතා කිරීම නිසා රු.1,692,000 ක් පමණක් උපයා තිබුණි. මෙම කාර්යය සමීක්ෂණය කළ විට වාර්ෂිකව සභාවට රු.1,296,000 ක් ආසන්න වශයෙන් අහිමි කිරීමට සිදුවේ. | JCB යන්ත්‍රය භාවිතා කිරීමේදී සිදුවන වියදමවත් පියවා ගත හැකි ආකාරයට භාවිතා කළ යුතු වීම. | මෙම කරුණ නිරවුල් කිරීම සිදුකරන බව කාරුණිකව දැනුම් දෙමි. |

**2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා සහ සියළුම බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දින වන විට සභාවට අයකර ගැනීමට පැවැති උසාවි දඩ මුදල රු.1,992,000 ක් සහ මුද්දර ගාස්තු රු.517,000 ක් වී තිබුණි. | මූලා‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. | උසාවි දඩ මුදල් සහ මුද්දර ගාස්තු සියල්ල අයකර ගෙන ඇති බව කාරුණිකව දන්වමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සභාවේ ආදායම් සහ වියදම් කිරීම් සඳහා ප්‍රධාන කාරණා සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සකස් කර ක්‍රියාත්මක කර තිබිය යුතුය. එසේ වුවත්, ප්‍රාදේශීය සභාව විසින් 2012 අගෝස්තු 04 දින | අදාළ පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මේ සම්බන්ධයෙන් දැනට ඉදිරි කටයුතු සඳහා නැගෙනහිර පළාතේ, පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් මෙම අතුරු ව්‍යවස්ථා සභාවට ඉදිරිපත් කර තීරණයන් ගැනීමෙන් පසුව තමන් වෙත ඉදිරිපත් කරන ලෙසට, පසුගිය මාසයේ දන්වා තිබුණි. මේ අනුව, සභාවේ තීරණය |

| | | |
|---|---|---|
| අතුරු ව්‍යවස්ථා සම්බන්ධයෙන් යෝජනා නැගෙනහිර පළාතේ, පළාත් පාලන අමාත්‍යාංශයට අනුමැතිය සඳහා යවා තිබූ නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් ඒ සඳහා අනුමැතිය ලබා ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | | කර පළාත් පාලන දෙපාර්තමේන්තුවට ලබා දී ඇති බවට කාරුණිකව දැනුම් දෙමි. |

**(ආ) ක්‍රියාකාරී සැලැස්ම**

| | | |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභා ආදායම් සහ විධිමත් කිරීම් සඳහා ප්‍රධාන කාරණා සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සකස් කර ක්‍රියාත්මක කළ යුතුව තිබුණි. එසේ වුවත්, අනුමැතිය ලබාගැනීම සඳහා සකස් කළඅතුරු ව්‍යවස්ථා ප්‍රකාරව සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබුණු කාර්යයන් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | අදාළ පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මෙම කරුණ නිරවුල් කරනු ලබන බව කාරුණිකව දැනුම් දෙමි. |

**(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| | | |
|---|---|---|
| ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් සභාව විසින් ක්‍රියාත්මක කළ දීර්ඝ කාලීන හා කෙටිකාලීන වැඩසටහන සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.6,641,603 ක් වැය කර තිබුණි. එසේ වුවත්, සභාවේ ආදායම් ලෙස රු.649,320 ක් පමණක් ලැබී තිබුණි. මෙම ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.<br>සභාව විසින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සංවර්ධනය කිරීමේ සැලසුම් මේ දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි. | පරිසරය සුරැකීමේ කමිටු ස්ථාපිත කර ඒ මඟින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සංවර්ධනය කිරීමේ සැලසුම් ක්‍රියාත්මක කළ යුතු වීම. | දැනට සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සමඟ එක්ව ගම්මානවල දැනුවත් කිරීමේ කමිටු සහ පරිසරය සුරැකීමේ කමිටු පිහිටුවීම සහ තවද, පාසල්වල ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව කමිටු ආශ්‍රිත දැනුවත් කිරීමේ කටයුතු සිදුකිරීම, ක්‍රියාත්මක කරනු ලබන බව කාරුණිකව දන්වමි. |

**(ඇ) තිරසාර සංවර්ධන අරමුණු**

| | | |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල රාජ්‍ය නායකයින්ගේ නායකත්වයෙන් 2015 වර්ෂයේ තිරසර සංවර්ධන සම්මේලනයේ තීරණය අනුව සභාව විසින් 2030 වර්ෂයේ ළඟාකරගත යුතු තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් මැනිම සඳහා දර්ශකයන් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. | දර්ශකයන් ඇතිකිරීම සඳහා කටයුතු කළ යුතු වීම. | මේ සඳහා වන උත්සාහයන් ගනු ලබන බව කාරුණිකව දන්වමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවේ ආදායම් සුපරීක්ෂක ලෙස නිලධාරියෙකු රාජකාරී කරනු ලබන නමුත්, මෙම නිලධාරියා විසින් සභාවේ ආදායම් ඉහළ නංවා ගැනීම සඳහා වූ යෝජනාවක් ඉදිරිපත් කර නොතිබුණි. | ආදායම් වර්ධනය කරගත හැකි යෝජනාවක් ඉදිරිපත් කර තිබිය යුතු වීම. | මෙම වර්ෂයේදී මෙම දෝෂ නිරවුල් කරන ලබන බව කාරුණිකව දන්වමි. |
| (ආ) | සභාවේ ඇති සැලසුම් අංශය සභාවේ අභිවෘද්ධිය සම්බන්ධයෙන් උපදෙස්, නව ආදායම් මාර්ග ඇතිකිරීමේ සමීක්ෂණයන් පවත්වා වාර්තා ඉදිරිපත් කිරීම, පරිසරය දූෂණය කරනු ලබන ආයතන පිලිබඳ වාර්තා ඉදිරිපත් කිරීම් සහ සංවර්ධන වැඩසටහන් හඳුනාගෙන ඒවා සාක්ෂාත් කළ හැකි මූලාශ්‍රයන් පිළිබඳ දැනුවත්ව වාර්තා ඉදිරිපත් කිරීම වැනි ප්‍රධාන කාර්යයන් ඉටුකිරීමේ ප්‍රමාද වීම් තිබූ බව නිරීක්ෂණය විය. මේ නිසා සභාවේ සහ ප්‍රදේශයේ සංවර්ධනයේ මන්දගාමී ස්වරූපයක් දක්නට ලැබුණි. | සැලසුම් අංශයේ රාජකාරී විධිමත් අයුරින් ඉටු කළ යුතු වීම. | මෙම වර්ෂයේදී මෙම දෝෂ නිරවුල් කරන ලබන බව කාරුණිකව දන්වමි. |
| (ඇ) | සභාවේ වැඩ සුපරීක්ෂකවරුන් දෙදෙනෙකු රාජකාරී කරනු ලබන | විධිමත් අයුරින් රාජකාරී බෙදා භාරදුන් කාර්යයන් | මෙම වර්ෂයේදී මෙම දෝෂ නිරවුල් කරන ලබන බව කාරුණිකව දන්වමි. |

| | |
|---|---|
| නමුත්, ඔවුන්ට ලබා දී තිබුණු රාජකාරී පිළිබඳව වැඩසටහන් ක්‍රියාත්මක වන විට එම වැඩසටහන් අධීක්ෂණය, මාර්ග සහ කානුවල සංඛ්‍යාව සහ එම ප්‍රවාහයන් මැනීම් සිදුකිරීම හා ඒවා ලේඛනගත කිරීම වැනි කාර්යයන් පමණක් ලබා දී තිබුණි. මෙලෙස රාජකාරී බෙදීම මඟින් මෙම නිලධාරීන් තම රාජකාරීයට අමතරව කාර්යයන් නොමැතිව සභාවේ සිටින බව නිරීක්ෂණය විය. | නිවැරදිව ඉටු කරන්නේද යන්න අධීක්ෂණය කළ යුතු වීම. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් දේපල බදු දීමේදී බදු ගිවිසුම් ඇප ලේඛනය ලැබිය යුතු බව සඳහන් වන නමුත් එවැනි ලේඛන හෝ ඇප මුදල් ලබාගෙන නොතිබුණි. | ඇප ලේඛන හෝ ඇප මුදල් ලබා ගිවිසුම් ගත විය යුතුය. | මෙම කරුණ නිවැරදි කර කටයුතු සිදුකරනු ලබන බව කාරුණිකව දැනුම් දෙමි. |
| (ආ) | මඩකලපුව විශ්වවිද්‍යාලය | | |
| | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි පුනානෙයි-නැගෙනහිර ග්‍රාම සේවක වසමේ මඩකලපුව විශ්වවිද්‍යාල ආයතනය විසින් ඉදිකරනු ලබන ගොඩනැගිලි සංකීර්ණය සම්බන්ධයෙන්, කාර්යාලයේ ගොඩනැගිලි ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කළ ගොඩනැගිලි ඉල්ලුම් පත්‍රය, ඉඩම් හිමිකම් ඔප්පුව, ඉඩමේ මිනින්දෝරු සැලැස්ම සහ සභාව විසින් ලබාදිය යුතු වූ නිරවුල් බවට ලේඛන සාක්ෂි, වීථි රේඛා සාක්ෂි ආදිය අඩංගු ලිපිගොනුව නොතිබුණි. එසේම, 2016 | නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමේදී, ඒ පිළිබඳ ගොඩනැගිලි අයදුම්පත්‍රය, ඉඩම් හිමිකම් ඔප්පු, මිනින්දෝරු ප්ලෑන සහ සභාව විසින් ලබාදිය යුතු වූ නිරවුල් බවට ලේඛන සහතිකය වීථි රේඛා, සහතිකය ආදිය සභාව විසින් ලබාගත යුතු වීම. | මෙම කරුණ සම්බන්ධයෙන් එවකට සභාවේ රාජකාරී කළ කාර්යාල නිලධාරියාගෙන් මේ පිළිබඳව විමසීමේදී සියළුම ලේඛව කාර්යාලයේ ඇති බව සඳහන් කරන ලදී. එසේ වුවත්, සභාවේ 2016-2018 දක්වා සංශෝධිත ගොඩනැගිලි නිර්මාණ සැලසුම් පමණක් විය. |

වර්ෂයේ සිට 2018 දක්වා සභාව විසින් අනුමත කළ සංශෝධනය කළ ගොඩනැගිලි නිර්මාණ සැලසුම් පමණක් දක්නට ලැබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 වත්කම් ලේඛනගත නොකිරීම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සභාව සතු ඉඩම් හා ගොඩනැගීලිවල මුළු වටිනාකම රු.87,251,496 ක් එකතුව ලෙස ගිණුම්වල ඉදිරිපත් කර තිබූ නමුත්, චංචල හා නිශ්චල දේපල ස්ථාවර වත්කම් ලේඛනයේ ලේඛනගත කිරීම සඳහා සභාව විසින් පියවර ගෙන නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනයේ ලේඛනගත කිරීමට කටයුතු කළ යුතු වීම. | පිළිගෙන ඇත. |

**3.4.2 නඩත්තුව හා අලුත්වැඩියාවන් සිදුකිරීම**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවේ අලුත්වැඩියා කළ නොහැකි තත්ත්වයේ පවතින වත්කම් අලුත්වැඩියා කිරීමට හෝ විකිණීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | භාවිතයට සුදුසු අයිතමයන් අලුත්වැඩියා කර හා භාවිතයට නුසුදුසු අයිතමයන් වෙන්දේසියේ විකිණීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. | පිළිගෙන ඇත. |
| (ආ) | ප්‍රාදේශීය සභාවේ තොග ගබඩාවේ විවිධ වත්කම් සහ තොග අයිතමයන් භාවිතයට සුදුසු හා නුසුදුසු අයිතමයන් වශයෙන් විවිධ අයිතමයන් පැවති නමුත් ඒවා සලකුණු කර අලුත්වැඩියා කිරීමට හෝ විනාශ කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබූ අතර, එමෙන්ම අලුත්වැඩියා කර භාවිතයට ගත හැකි භාණ්ඩ අලුත්වැඩියා කොට ආරක්ෂිත ආකාරයට අසුරා තැබීමට කටයුතු කර නොතිබුණි. | භාවිතයට සුදුසු භාණ්ඩ අලුත්වැඩියා කර ද, භාවිතයට නුසුදුසු භාණ්ඩ සමීක්ෂණය කර වෙන්දේසියේ විකිණීමට කටයුතු කළ යුතු වීම. | මෙම දෝෂ නිවැරදි කරනු ලබන බව කාරුණිකව දන්වමි. |

**3.5 ප්‍රසම්පාදනය**

**3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රාදේශීය සභාව විසින් භාණ්ඩ හා සේවාවන් ක්‍රියාවලිය සඳහා සකසා තිබිය යුතුය. එසේ වුවත්, සභාව විසින් භාණ්ඩ සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. සේවාවන් සඳහා පිළියෙල කළ ප්‍රසම්පාදන සැලැස්ම, පිළියෙල කිරීම සඳහා වූ මූලික ලියවිල්ල, යෝජනා, පළාත් පාලන ආයතනවල වර්ෂ 04 ක සංවර්ධන සැලැස්මේ වූ යෝජනාවල සඳහන් සේවාවන් ආදිය අනුගමනය නොකර පිළියෙල කරන ලද්දකි. | විධිමත් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ඒ අනුව ක්‍රියා කළ යුතු වීම. | මෙම දෝෂ කඩිනමින් නිවැරදි කරනු ලබන බව කාරුණිකව දැනුම් දෙමි. |

**4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී අභ්‍යන්තර විගණන කටයුතු ක්‍රියාත්මක වී නොතිබුණි. | විගණන කමිටු ස්ථාපිත කර අභ්‍යන්තර විගණන කාර්යයන් ක්‍රියාත්මක කළ යුතු වීම. | මෙම අඩුපාඩු නිවැරදි කරනු ලබන බව කාරුණිකව දැනුම් දෙමි. |

**4.2 විගණන හා කළමනාකරණ කමිටු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | විගණන කමිටු රැස්වීම් පවත්වා ගැටළු සඳහා විසදුම් ලබාගත යුතුවේ. | මෙම අඩුපාඩු නිවැරදි කරනු ලබන බව කාරුණිකව දැනුම් දෙමි. |

**5.** **පද්ධති හා පාලන**

| | විගණන නිරීක්ෂණ පාලන ක්ෂේත්‍රය | විශේෂ අවධානය යොමු කළ යුතු විෂයයන් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ආදායම් කළමනාකරණය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | එක් එක් ක්ෂේත්‍රය ඉදිරියේ දක්වා ඇති විෂයයන් පිළිබඳව අදාළ ක්‍රියාමාර්ග ගත යුතු වීම. | මෙම කරුණු නිරවුල් කරනු ලබන බව කාරුණිකව දැනුම් දෙමි. |
| (ආ) | අයවැය පාලනය | අයවැය පිළියෙල කිරීමේදී පසුගිය කාලයේ තථ්‍ය වියදම් සැලකිල්ලට ගත යුතු වීම. | | |
| (ඇ) | ස්ථාවර වත්කම් පාලනය | (i) ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යාම.<br>(ii) සභාවේ භාවිතා නොකර නිෂ්කාර්යව පවතින ස්ථාවර වත්කම් භාවිතා කිරීමට කටයුතු කළ යුතු වීම. | | |